# මිලින්ද මොරගොඩ ශ්‍රී ලංකාවේ වත්මන් අර්බුද ගැන 'ඉන්දියන් එක්ස්ප්‍රස්' වෙත පැහැදිලි කරයි



**මහින්ද අලුත්ගෙදර**

ශ්‍රී ලංකා මහ කොමසාරිස් මිලින්ද මොරගොඩ මහතා ඉන්දියන් එක්ස්ප්‍රස් (Indian Express) පුවත්පත පැවැත් වූ 'අදහස් හුවමාරු කරගැනීමේ' වැඩසටහනකට සහභාගි වී තිබේ.

ඉන්දියන් එක්ස්ප්‍රස් පුවත්පත පසුගිය 1 දා පැවැත්වූ 'අදහස් හුවමාරු කරගැනීමේ' වැඩසටහන සඳහා ඉන්දියාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් මිලින්ද මොරගොඩ මහතාට ඇරයුම් කර තිබෙන අතර මෙම වැඩසටහන නොයිඩා හි පිහිටි ඉන්දියන් එක්ස්ප්‍රස් පුවත්පත් මූලස්ථානයේ දී පවත්වා ඇත.

ඉන්දියන් එක්ස්ප්‍රස් හි ජ්‍යෙෂ්ඨ කතෘවරුන්ගේ කාර්ය මණ්ඩලය සමග සිදු කරන අදහස් හුවමාරුවක් ලෙස පැවැත්වුණු මෙම වැඩසටහනින් සෑම සතියකට වරක් කැපී පෙනෙන පුද්ගලයකු පිළිබඳ පළ කරයි.

පුවත්පතේ ප්‍රධාන කර්තෘ වන රාජ් කමල් ජා ප්‍රමුඛ ඉන්දියන් එක්ස්ප්‍රස් පුවත්පතේ ජ්‍යෙෂ්ඨ කර්තෘවරු මෙම වැඩසටහන අතරතුර මහ කොමසාරිස් මොරගොඩ මහතා වෙත ප්‍රශ්න කිහිපයක් ඉදිරිපත් කළ තිබෙන අතර ශ්‍රී ලංකාවේ වත්මන් දේශපාලන ප්‍රවණතා, ශ්‍රී ලංකාවේ ආර්ථික තත්ත්වය සහ ඉන්දු-ශ්‍රී ලංකා සබඳතා යන කරුණු මෙම ප්‍රශ්න මගින් විශාල වශයෙන් ආවරණය කර ඇත. මෙම සාකච්ඡාව ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදී ශුභජිත් රෝයි මෙහෙය විය.